# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,882/2 — 1969 දෙසැම්බර් 12 වැනි සිකුරාද — 1969.12.12

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ජෙදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

ඞී. 30/61.

### 1961 අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධි විධාන) පනත 10 වැනි වගන්තිය යටතේ වූ ආඥාව

ගා/ගනේගම බෞද්ධ මිශ්‍ර පාසල—බද්දේගම

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍ය තැන්පත් ඉමියා මුදියන්සේලාගේ රපියෙල් අභයවංශ ඊරියගොල්ල වන මම, 1961 වර්ෂයේ අංක 8 දරණ උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතේ 10 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව ක්‍රියා කරමින් 1962 වර්ෂයේ ජූනි මස 15 වැනි දින අංක 13,169 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළවූ අංක 1457 දරණ පවරා ගැනීමේ ආඥාව, මෙයට යාකර ඇති උප ලේඛනයේ නිශ්චය වශයෙන් දක්වා තිබෙන දේපොළ කෙරෙහි බලපෑම හැර 1970 වර්ෂයේ ජනවාරි මාසයේ 1 වැනි දින සිට බල පැවැත්වෙන පරිදි මේ ආඥාවෙන් අවලංගු කරමි.

අයි. ඇම්. ආර්. ඒ. ඊරියගොල්ල,
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍ය.

1969 දෙසැම්බර් මස 6 වැනි දින,
කොළඹ දීය.

### උපලේඛනය

1. 1960 ජුලි මස 21 වැනි දින බද්දේගම ගා/ගනේගම බෞද්ධ මිශ්‍ර පාසල පැවැත්වූවාවූත් නඩත්තු කරනු ලැබූවාවූත් ස්ථානය, එනම් දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ ගාල්ල ගහබඩ පත්තුවේ දකුණු ගනේගම පිහිටියාවූත් වැලිලියැද්ද නමින් හැඳින්වෙන ඉඩමෙන් කොටසක්වූත්,

උතුරෙන් : උඩුමුල්ල වත්ත, සන්දරවල (කොටසක්) සහ එච්. ඇල්. සැමුවෙල්ට අයිති පිඹුරු අංක 1059 ඒ දරණ පර්චස් 14·625 විශාල ඉඩමෙන්ද,

නැගෙනහිරින් : උඩුමුල්ල වත්ත, වඳුරඹ-බද්දේගම ප්‍රසිද්ධ පාර, එච්. ඇල්. සැමුවෙල්ට අයිති පිඹුරු අංක 1059 ඒ දරණ පෙරකී ඉඩමෙන් සහ වැලිලියද්ද වත්තේ කොටසකින්ද,

දකුණෙන් : එච්. ඇල්. සැමුවෙල්ට අයිති පිඹුරු අංක 1059 ඒ දරණ පෙර කී ඉඩමෙන් සහ වැලිලියද්ද වත්තේ කොටසකින්ද,

බස්නාහිරෙන් : සන්දරවල කොටසකින්, වැලිගොඩැල්ල සහ වැලිලියද්දවත්තේ කොටසකින්ද,
මායිම්වූත් රූඩ් දෙකක් (අ. 0 රූ. 2 ප. 0) පමණ විශාලවූත් ඉඩම් කොටස සම්පූර්ණයෙනි.

2. මෙම උප ලේඛනයේ 1 වැනි ඡේදයෙන් නියමිත වශයෙන් දක්වෙන ඉඩමේ පිහිටි ගොඩනැගිලි හා නිර්මාණයන් සියල්ලම.

3. ඉහත කී විද්‍යාලය හා එම විද්‍යාලය වෙනුවෙන් තබා ඇති වාර්තා හා බඩු ලේඛනවලින් ජාතික අධ්‍යාපන සමීක්ෂණ ආකෘති පත්‍රවල ප්‍රකාශිත එම විද්‍යාලය පවත්වා නඩත්තු කිරීම සඳහා පාවිච්චි කරන ලද සියළුම චංචල දේපලද,

4. අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගෙන් එකී පාසලට ආධාර මුදල් වශයෙන් ලැබිය යුතු පාසල සතු සියලුම මුදල්ද, ඉහත කී විද්‍යාලය වෙනුවෙන් එම විද්‍යාලයේ අයිතිකරු හෝ වෙනයම් තැනැත්තෙක් හෝ තැනැත්තන් විසින් හෝ තබා ගන්නා ලද විද්‍යාලය නමින් පවත්නා වෙනත් සියළු ආධාර මුදල්, ගාස්තු, ත්‍යාග හා පරිත්‍යාග මුදල් ආදී විද්‍යාලයට අයත් සියළුම මුදල්ද ඇතුළත්ය.

12–414

---

### 1961 අංක 8 දරන උපකෘත පාඨශාලා හා ගුරු විද්‍යාල (අතිරේක විධි විධාන) පනත

පවරා ගැනීමේ නියෝග අංක 2610

කො/ශාන්ත ජෝන් බොස්කෝ විද්‍යාලය, කළුඅග්ගල, හන්වැල්ල

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍ය තැන්පත් ඉමියා මුදියන්සේලාගේ රපියෙල් අභයවංශ ඊරියගොල්ල වන මම, 1961 අංක 8 දරණ උපකෘත පාඨශාලා හා ගුරු විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතේ 4 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, මෙයට යාකොට ඇති උප ලේඛනයේ නියමිත වශයෙන් සඳහන්කර ඇත්තාවූද පවරාගනු ලැබීමට යටත්වූද සියලුම දේපල 1970 වර්ෂයේ ජනවාරි මාසයේ 1 වෙනි දින සිට බලපැවැත්වෙන පරිදි රජයට පවරා ගනු ලබන බව මෙයින් ප්‍රකාශ කරමි.

952/3——ජේ 9224—11,075 (69/12)

## උප ලේඛනය

1. **'ඒ' කැබැල්ල.**—කළුඅග්ගල, කො/ශාන්ත ජෝන් බොස්කෝ විද්‍යාලයේ හස්ත කර්මාන්ත හා බාලදක්ෂ කාමරය 1968 ජනවාරි 1 වැනි දින පවත්වා නඩත්තු කරනු ලැබූ ස්ථානය, එනම්, බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ, නැගෙනහිර හේවාගම් කෝරළයේ, කළුඅග්ගල පිහිටි, උතුරින්, අංක 2028 දරණ පැවරුම් නියෝගය අනුව කො/කළුඅග්ගල රෝ. ක. පාඨශාලාව සඳහා පවරාගත් ඉඩමෙන්ද, නැගෙනහිරින්, එකී හස්ත කර්මාන්ත කාමරයේ නැගෙනහිර බිත්තියට සමාන්තරවද, එකී බිත්තියට හා දේවස්ථානයේ කල්වාරිය පිහිටි කුළුණේ පතුළට අඩි 12ක් දුරින් ද විහිදෙන සෘජු රේඛාවකින්ද, දකුණින්, එකී දේවස්ථානයේ කල්වාරිය පිහිටි කුළුණේ පතුලෙන් හා එකී හස්ත කර්මාන්ත හා බාලදක්ෂ කාමරයේ දකුණෙන්ම පිහිටි බිත්තියට සමාන්තරව හස්ත කර්මාන්ත හා බාලදක්ෂ කාමරයේ එකී බිත්තියට අඩි 5ක් දුරින් විහිදෙන අඩි 18ක් දිග සෘජු රේඛාවකින්ද, බස්නාහිරින්, ආණ්ඩුවේ ඉඩමෙන්ද, මායිම්වූ පර්චස් 6ක් පමණ විශාල ඉඩම සම්පූර්ණයෙනි.

**'බී' කැබැල්ල.**—කළුඅග්ගල, කො/සාන්ත ජෝන් බොස්කෝ විද්‍යාලය, 1968 ජනවාරි 1 දින පවත්වා නඩත්තු කරනු ලැබූ ස්ථානය, එනම් බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ නැගෙනහිර හේවාගම් කෝරළයේ කළුඅග්ගල පිහිටි උතුරින්, කළුඅග්ගල සාන්ත ජෝන් බොස්කෝ දේවස්ථානයේ ඉතාම දකුණින් පිහිටි බිත්තියට සමාන්තරව, එකී දේවස්ථාන ගොඩනැගිල්ලේ නිරිත දිග මුල්ලට අඩි 10ක් දකුණින්වූ ලක්ෂ්‍යයකින් ආරම්භව දිවෙන අඩි 70ක් දිග සෘජු රේඛාවකින් හා එතැන් සිට ඊසාන දෙසට බරව විහිදෙමින්, අංක 2028 දරණ පවරාගැනීමේ නියෝගය යටතේ කො/කළුඅග්ගල රෝ. ක. පාඨශාලාව සඳහා දැනටම ආණ්ඩුවට පවරාගෙන ඇති ඉඩමේ මායිම දක්වා දිවෙන සෘජු රේඛාවකින් හා එකී රෝ. ක. පාඨශාලාව සඳහා පවරාගත් දේපලින් හා අඹගහවත්ත නමැති ඉඩමෙන්ද, නැගෙනහිරින්, අඹගහවත්තෙන්ද, දකුණින්, ('සී' කැබැල්ල වශයෙන් පවරා ගැනීමට නියමිත) සාන්ත ජෝන් බොස්කෝ විද්‍යාලයේ ක්‍රීඩා භූමියෙන්ද, බස්නාහිරින්, ප්‍රේක්ෂාගාරයට හා ක්‍රීඩා භූමියට පිවිසෙන ඉතාම බස්නාහිරින් පිහිටි පඩි පෙලට අඩි 10ක් බස්නාහිරින්වූ ලක්ෂ්‍යයක සිට එකී දේවස්ථාන ගොඩනැගිල්ලේ නිරිතදිග මුල්ලේ සිට අඩි 10ක් දකුණින්වූ ලක්ෂ්‍යයක් දක්වා උතුරු දෙසට විහිදී යන රේඛාවකින්ද මායිම්වූ පර්චස් 90ක් පමණ විශාල ඉඩම සම්පූර්ණයෙනි.

**'සී' කැබැල්ල.**—1968 ජනවාරි 1 දින ප්‍රයෝජනයට ගෙන නඩත්තු කරනු ලැබූ කළුඅග්ගල, කො/සාන්ත ජෝන් බොස්කෝ විද්‍යාලයේ ක්‍රීඩා භූමිය එනම්, බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ නැගෙනහිර හේවාගම් කෝරළයේ, කළුඅග්ගල පිහිටි උතුරින්, ඉහත 'බී' කොටස යනුවෙන් පවරාගනු ලැබූ දේපළෙන්ද, අඹගහවත්ත නමින් හැඳින්වෙන ඉඩමෙන් හා හෙලඋඩවත්ත නොහොත් හෙලඋඩලන්ද නමැති ඉඩමෙන්ද, නැගෙනහිරින් හෙලඋඩවත්ත නොහොත් හෙලඋඩලන්ද නමැති ඉඩමෙන්ද, දකුණින් හෙලඋඩවත්ත නොහොත් හෙලඋඩලන්ද නමැති එම ඉඩමෙන්ද, බස්නාහිරින් කළුඅග්ගල ලබුගම ර. වැ. දෙ. පාරෙන්ද මායිම්වූ අක්කර දෙකක් පමණ විශාල ඉඩම සම්පූර්ණයෙනි.

රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ කළුඅග්ගල-ලබුගම පාරෙන් හා කොළඹ-අවිස්සාවේල්ල පාරෙන් ආරම්භව දේවස්ථානයටත් මිසම් නිවාසය හා දේවස්ථානය අතරින් ඉන් ඔබ්බටත්, යැමට දැනට තිබෙන පාර ඔස්සේ දේවස්ථාන භූමි භාගයට පිවිසෙන ප්‍රධාන දොරටුවෙන් කළුඅග්ගල ශාන්ත ජෝන් විද්‍යාලයේ ක්‍රීඩා භූමියේ කණ්ඩියේ සිට ඒ. බී. සී. යන ඉඩම් කැබලිවලට වාහන ගෙන යාම් ඊමේ හා පයින් යාම ඊමේ මාර්ග අයිතියක් සමගයි.

**'ඩී' කැබැල්ල.**—ශාන්ත ජෝන් බොස්කෝ විද්‍යාලයේ විද්‍යාලයාධිපතිගේ නිවාසය පිහිටි භූමිභාගය, එනම්, බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ නැගෙනහිර හේවාගම් කෝරළයේ කළුඅග්ගල පිහිටි, උතුරින්, කොළඹ අවිස්සාවේල්ල ර. වැ. දෙ. පාරෙන්ද, නැගෙනහිරින් වලව්වත්තෙන්ද, දකුණින් මූනවලේ නොහොත් සාන්ත රීටා වත්තෙන්ද, බස්නාහිරින් ද, මූනවලේ නොහොත් සාන්ත රීටා වත්තෙන්ද, මායිම්වූ පර්චස් 80ක් පමණ විශාල ඉඩම සම්පූර්ණයෙනි.

2. 1, 2, 3 හා 4 යන ඡේදවල නියමිත වශයෙන් සඳහන්කර ඇති ඉඩමේ පිහිටි ගොඩනැගිලි හා නිර්මාණයන් සියල්ල, එනම්, 'ඒ' කොටසේ පිහිටි හස්ත කර්මාන්ත හා බාලදක්ෂ කාමරයද, 'බී' කොටසේ පිහිටි, විද්‍යා රසායනාගාර හා පන්ති කාමරවලින් යුත් දෙමහල් ගොඩනැගිල්ල හා පන්ති කාමර, රැස්වීම් ශාලාව, හා පුස්තකාලය පිහිටි දෙමහල් ගොඩනැගිල්ලද,

'සී' කොටසේ පිහිටි තට්ටු පෙලින් යුත් එලිමහන් වේදිකාව හා දෙමහල් ප්‍රේක්ෂාගාරයද, 'ඩී' කොටසේ පිහිටි විද්‍යාලයාධිපතිගේ නිවාසය හා අනෙකුත් සියලුම නිර්මාණයන්ද

3. ජාතික අධ්‍යාපන සමීක්ෂණ පෝර්මවල ප්‍රකාශකර ඇති පරිදි එකී පාසැල පවත්නා නඩත්තු කිරීම සඳහා පාවිච්චි කරන ලද සියලුම චංචල දේපල හා එකී පාසැලේ හෝ පාසැල වෙනුවෙන් තබා ගන්නා ලද බඩු වට්ටෝරු පොත් හා ලේඛන.

4. අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් ලැබිය යුතු ආධාර මුදල් වශයෙන් එකී පාසැලේ බැරට ඇත්තාවූ සියලුම මුදල් හා එකී පාසැල සඳහා හා ඒ වෙනුවෙන් එහි අයිතිකරු හෝ වෙනත් අයෙකු හෝ අය භාරයේ තිබෙන වෙනත් ආධාර මුදල්, ගාස්තු, ත්‍යාග හා පරිත්‍යාග අරමුදල් සියල්ලම.

අයි. ඇම්. ආර්. ඒ. ඊරියගොල්ල,
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍ය.

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය,
මැලේ වීදිය,
කොළඹ 2, 1969 දෙසැම්බර් මස 6 වැනි දින,

12–415

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රපිතයි